# ආයෝජන වලට පාර්ලිමේන්තු අනුමැතිය

රටක් සංවර්ධනය කරා ගමන් කිරීමේදී ආයෝජන වල වැදගත්කම හඳුනාගත යුතුය. රාජ්‍ය අංශයෙන් කෙරෙන ආයෝජන මෙන්ම පෞද්ගලික අංශයෙන් කෙරෙන ආයෝජන ද ජාතික සංවර්ධන ප්‍රයත්නය ශක්තිමත් කරයි. රාජ්‍ය ආයෝජන සඳහා මැදිහත්වන්නේ ආණ්ඩුවයි. විදේශ සබඳතා ඔස්සේ ලැබෙන මූල්‍ය ශක්තියත් දේශීය අරමුදල් වල දායකත්වයත් ඇතිව රාජ්‍ය ආයෝජන පරිමාව තීරණය වෙයි. ශ්‍රී ලංකාව ගතවූ වසර කිහිපය තුල වාර්ෂික ජාතික ආදායමෙන් සියයට 6 ක පමණ ප්‍රතිශතයක් රාජ්‍ය ආයෝජන සඳහා කැප කළේය. මිත්‍ර රටවල ආර්ථික සහයෝගය මෙන්ම ලෝක බැංකුව ආසියානු සංවර්ධන බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ද මේ සඳහා සහය ලබාදුනි. ශ්‍රී ලංකා ආණ්ඩුව අනුගමනය කරන සංවර්ධන ප්‍රතිපත්ති ජාත්‍යන්තර ප්‍රජාවගේ ඇගයුමට ලක්වීමත් ඒවායින් ජනතාව ලබන ප්‍රතිලාභ මැනවින් තේරුම් ගෙන තිබීමත් නිසා අප රටට අඛණ්ඩව ජාත්‍යන්තරයෙන් උදව් පදව් හිමිවී තිබේ.

රාජ්‍ය ආයෝජන හොඳ මට්ටමකින් පවත්වා ගන්නා අතර ආර්ථිකයේ තවත් ක්ෂේත්‍ර ගණනාවක ප්‍රගතිය පසුගිය වසර කිහිපය තුලදී හඳුනාගන්නට හැකිවිය.කලින් සියයට දහයක්ව තිබූ අය වැය හිඟය සියයට හතක් දක්වා ක්‍රමවත්ව අඩු කර ගන්නට හැකිවීම අපේ ආර්ථිකය ලැබූ ලොකු ජයග්‍රහණයකි. රාජ්‍ය ණය බර සියයට එකසිය දෙකේ සිට සියයට අසූව දක්වා අඩුකර ගැනීමටත්, සමස්ථ ආර්ථික වර්ධනය සියයට හයකට වඩා වැඩි මට්ටමක පවත්වා ගැනීමටත්, රැකී රක්ෂා හිඟය සියයට අටේ සිට සියයට පහ දක්වා අඩු කර ගැනීමටත්, කලින් සියයට විස්සක්ව පැවති උද්ධමන

වේගය සියයට හත දක්වා අඩු කර ගැනීමට හැකි වීමත් ආර්ථිකයේ ප්‍රගතිය තහවුරු කළ ජයග්‍රාහි අවස්ථාවන් වේ.

මෙම ජයග්‍රාහණ ලබා ගන්නා අතර තුර රටේ දිලිඳුකම සියයට අටක් දක්වා අඩුවිය. සමස්ථ දිවයින පුරා ක්‍රියාත්මක වන සංවර්ධන යෝජනා ක්‍රමවල බලපෑම දිලිඳුකම අඩුවීමට බලපෑවේය. මේ ආකාරයට රටේ ආර්ථික ගමන් මග යහපත් තත්ත්වයට හැරීම නිසා ජාත්‍යන්තරයේ විශ්වාසය තව තවත් තහවුරු විය. ඒ නිසාම විදේශ වෙළඳ පොලෙන් අප රටට ණය ලබා ගැනීමට තිබූ අවස්ථා තවතවත් පුළුල් වූයේය. පසුගියදා විදේශ වෙළඳපොලෙන් ලබාගත් ඇමෙරිකානු ඩොලර් මිලියන 1000 ණය මුදල වසර දහයකින් ගෙවිය යුතු දිගු කාලීන ණය මුදලකි. ඒ සඳහා නියම වූ පොලි අනුපාතය සියයට හයයි දශම දෙකයි පහකි. රජය එම ණය මුදල ලබාගෙන කලින් ඊට වැඩි පොලියකට ලබා ගෙන තිබූ ණය පියවා පැරණි ණය බරින් නිදහස් විය. නමුත් මේ කටයුතු ගැන ඇත්ත නොදන්නා ඇතැම් පාර්ශ්ව ප්‍රසිද්ධ වේදිකාවල කියන්නේ ආණ්ඩුව ගිණි පොලියට වාණිජ ණය ලබා ගන්නවා කියාය. එම අරමුදල් උපයෝගි කර ගෙන අතීතයේ පොලියට ලබා ගත් ණය ගෙවා, ණය බරින් මිදුනු බව සඳහන් නොකරති. මේ ආකාරයට සත්‍යය විකෘති කිරීමෙන් ජනමතය වෙනස් කිරීමේ හැකියාවක් ඇතැයි ඔවුන් සිතනවා වන්නට පිළිවන.

රාජ්‍ය ආයෝජන විධිමත් කිරීමත්, ආර්ථිකයේ අනෙක් සියලු අංශවල ප්‍රගතිය ඇතිවීමත් සමග පෞද්ගලික අංශයේ ආයෝජන ප්‍රමාණයද ඉහළ ගියේය. පෞද්ගලික ආයෝජන ක්‍රමවත්ව හා විධිමත්ව සිදු කිරීමට ගත් පියවර හේතුවෙන් ආයෝජකයන්ගේ විශ්වාසය ද වැඩි විය. මේ සඳහා ප්‍රථම කොට 2007 අයවැය ලේඛනය මගින් ක්‍රමෝපායික සංවර්ධන ව්‍යාපෘති පනතක් පැනවීමට යෝජනා කැරිණි. 2008 වසරේදී මෙම පනත පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී. එමගින්

ආයෝජන සම්බන්ධව පාර්ලිමේන්තුවට වගකීමක් පැවරෙන අතර ඒවා ගැන ජනතාවට තොරතුරු දැනගන්නට ලැබෙන ක්‍රමවේදයක් ද ඇරැඹිනි. නව පනත මගින් ආයෝජන සඳහා පාර්ලිමේන්තු අනුමතිය ලබා ගැනෙන ක්‍රමයක් හඳුන්වා දෙනු ලැබිණි.

එයින් ආයෝජන වල විනිවිද භාවය තවත් වැඩි විය. මේ ආකාරයට විශාල ආයෝජන සඳහා පාර්ලිමේන්තු අනුමැතිය ලබාගැනීම මගින් ඊට පුළුල් සමාජ දැණුවත් භාවයක් ලැබේ. ආණ්ඩුවේ සහ විපක්ෂයේ මැති ඇමතීන්ට මෙකී ආයෝජනයේ ගුණ අගුණ හඳුනා ගන්නටත් ඒ ගැන තිබෙන විවේචන ඉදිරිපත් කරන්නටත් පාර්ලිමේන්තුව කදිම වේදිකාවකි. ආයෝජන ගැන කෙරෙන පාර්ලිමේන්තු වාද විවාද වලදී මතු වන සාධනීය අදහස් රටේ සමස්ථ ආයෝජන ක්‍රමවේදය ඉදිරියේදී නිවැරදි කර ගන්නට හේතු වෙයි.

ආයෝජනයේ ස්වාභාවය එමගින් ජාතික ආර්ථිකයට ලැබෙන දායකත්වය එම ආයෝජනය සඳහා පිරිනමන සහන සියල්ලට පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීමට වඩා හොඳ ක්‍රමයක් මෙතෙක් ආයෝජන සම්බන්ධව ක්‍රියාත්මක වී නැත. මෙම ක්‍රමය ස්ථාපිත වීමට පෙර ආයෝජන මණ්ඩලයෙන් හෝ වෙනත් ඉහළ පෙළේ රාජ්‍ය ආයතනයකින් ආයෝජන සඳහා යම් යම් සහන ප්‍රදානය කළ විට ඊට සම්බන්ධ දේශපාලන බලධරයන් හෝ නිළධාරීන් වෙත ඇතැම්හු චෝදනා එල්ල කළහ. මේ නිසා විශේෂයෙන්ම ඉහළ පෙළේ රාජ්‍ය නිලධරයන් මෙබඳු තීරණ ගන්නට පැකිලීම ස්වභාවිකය. එහෙත් යම් ආයෝජන ව්‍යාපෘතියක් පාර්ලිමේන්තුවෙන් අනුමත වු පසු එය හරි හැටි ක්‍රියාත්මක කරන්නට නිලධරයන්ට මෙන්ම දේශපාලන බලධරයන්ටද නිදහසක් හිමිවෙයි. රටේ මූල්‍ය පාලනයේ තීරණාත්මක සහ අවසානාත්මක වගකීම ඇත්තේ පාර්ලිමේන්තුවටයි. එබැවින් යම් ආයෝජනයකට පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීම උපරිම විනිවිද භාවය ප්‍රදර්ශනය වන අවස්ථාවකි.

ක්‍රමෝපායික සංවර්ධන ව්‍යපෘති පනත සම්මත වීමෙන් පසු විශාල ආයෝජන ව්‍යාපෘති ගණනාවක් හඳුනාගෙන අනුමත කිරීමේ ක්‍රියාවලිය ඇරඹිනි. මෙම ප්‍රධාන ව්‍යපෘති පහත සඳහන්ය.

1. මන්නාරමේ සිදු කෙරෙන ඛනිජ තෙල් කැණීම සඳහා වන ව්‍යාපෘතිය.
2. කොළඹ නගරයේ ඉදිකිරීමට යෝජිත හෝටල් සහ සාප්පු සංකීර්ණ සහ නිවාස ව්‍යාපෘතිය. (මෙයට ෂංග්‍රිලා හෝටල් ව්‍යාපෘතිය ද අයත්ය)
3. ෂැංග්‍රිලා හෝටලය ඉදි කිරීමට යාබද භූමි භාගයේ ඉදි කෙරෙන කැටික්/එච්ක් හෝටල් සාප්පු, සම්මන්ත්‍රණ ශාලා සහිත සුඛෝපභෝගී නිවාස ව්‍යපෘතිය.
4. වානේ සංස්ථාව පුළුල් කිරීම සඳහා වූ ආයෝජන ව්‍යාපෘතිය.

මෙම ප්‍රධාන ආයෝජන ව්‍යාපෘති වල කටයුතු ක්‍රමවත් ලෙස කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් ජ්‍යේෂ්ඨ ලේකම්වරුන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇත. කමිටුවේ සභාපතිත්වය දරන්නේ අග්‍රාමාත්‍ය ලේකම් එස්. අමරසේකර මහතාය. එහි සෙසු සාමාජිකයන් වන්නේ අමාත්‍ය මණ්ඩල ලේකම් සුමිත් අබේසිංහ, මහා මාර්ග හා වරාය අමාත්‍යංශ ලේකම් සුජාතා කුරේ, විදුලිබල හා

බලශක්ති අමාත්‍යංශ ලේකම් එච්. එම්. සී. ප්‍රදීනන්දු - වාරිමාර්ග සහ ජලසම්පත් කළමණාකරන අමාත්‍යංශ ලේකම් අයිවන් ද සිල්වා. ජලසම්පාදන හා ජලාපවාහන අමාත්‍යංශ ලේකම් ඒ. අබේගුණසේකර සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යංශ ලේකම් රංජිත් ද සිල්වා යන මහත්ම මහත්මීන්ය.මෙම උසස් නිළධාරීන්ගෙන් සමන්විත කමිටුව රටේ ආයෝජන ක්‍රියාවලිය ක්‍රමවත් කිරීම හා අධීක්ෂණය සිදුකරයි.

# විදේශ ණය උගුලක්ද

විදේශ ණය හා ආධාර ගැන සමාජයේ විවිධ කොටස් අතර වාද විවාද තිබේ. සංවර්ධනය වන රටකට ණය හා ආධාර අවශ්‍ය බව බහුතර ජනතාව පිළිගනිති. විදේශ ණය හා ආධාර ජාත්‍යන්තර උගුලක් බව කියන්නෝද වෙති. 'ණය අරගෙන රට වික්කා' යනු සමහරුන්ගේ ජනප්‍රිය සටන් පාඨයකි. එහෙත් යථාර්ථය මේ මතවාද වලට වඩා වෙනස්ය. රටක් පාලනයේදී පාලකයා පවත්නා ආර්ථික සහ දේශපාලන යථාර්ථයන් සමග ගනුදෙනු කළ යුතුය. අද සුපිරි ඇමෙරිකා එක්සත් ජනපදයටවත් ණය නොමැතිව පැවතීම අපහසු වී තිබේ.

ශ්‍රී ලංකාව විදේශවලින් ණය හා ආධාර ලබාගන්නේ ජාතික සංවර්ධන ප්‍රයත්නය සඳහාය. අපට හාල් පොල් මාළු කරවල මිලදී ගන්නට විදේශ ණය හෝ ආධාර ලැබෙන්නේ නැත. ණයක් සැපයීමට පෙර ණය සපයන රට හෝ ආයතනය ඊට අදාළ ව්‍යාපෘතියේ වාණිජමය වටිනාකම අගැයීමට ලක්කරයි. එම ව්‍යාපෘතිය හරහා බිහිවන ව්‍යාපාර රැකී රක්ෂා ප්‍රමාණය නිෂ්පාදන හා ආයෝජන ක්‍රියාවලියද සැලැකිල්ලට ගෙන ණය සඳහා අයකරන පොලී අනුපාතය නියම කරයි. ඒ සමග ණය ආපසු ගෙවීමට ලැබෙන කාලසීමාවද නීර්ණය කෙරෙයි. මේ ආකාරයට පිරිවැය වාසි විග්‍රහයකින් පසු ණයක් අනුමත කිරීම පිළිගත් ක්‍රමයයි. අදාළ ණය සපයන ආයතනය සහ භාණ්ඩාගාරයේ ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව මෙයට මැදිහත්වන පාර්ශව දෙකයි.

සාමාන්‍යයෙන් සංවර්ධන ව්‍යාපෘතියක් සඳහා ලබාගැනෙන ණය මුදලක් වෙනුවෙන් පොලී අනුපාත තීරණය කෙරෙන ක්‍රම ගැනද ජනතාව දැනගත යුතුය. සංවර්ධන ව්‍යාපෘතියෙන් ව්‍යාපෘතියට පොලී අනුපාතය වෙනස් වෙයි. එසේම ණය ආපසු ගෙවන ක්‍රම වේදයද වෙනස් වෙයි. සංවර්ධන ව්‍යාපෘතියක පළමු අදියර හා දෙවැනි අදියර ආදී වශයෙන් අවස්ථා ගණනාවක් පසුකරන නිසා මේ අදියරෙන් අදියරට ණය ගෙවන ක්‍රමය හා පොලී අනුපාත වෙනස් වන බව සඳහන් කළ හැක.

විදේශ ණය ලබාගැනීම හා පොලී ගෙවීම ගැන දුර්මත රාශියක් රටේ පවත්නා නිසා එය උදාහරණයකින් පැහැදිලි කිරීම උචිත බව හැඟේ. නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය සඳහා රජය ලබාගත් ණය මුදල් වසර 20 කින් ගෙවීමට නියමවී තිබේ. මේ 20 වසරට වසර 5ක සහන කාලයක්ද ඇතුලත්ය. මෙම ණය මුදල සඳහා චීනය අයකරන්නේ 2%ක් තරම් අඩු පොලියකි. මෙතරම් සහන කාලයක් හා අඩු පොලියක් නියම වූයේ විදුලිය සෘජුවම අපනයනය කොට ආදායම් ලබන භාණ්ඩයක් නොවන නිසාය. කෙසේ හෝ නොරොච්චෝලේ ගල් අඟුරු විදුලි බලාගාර ව්‍යාපෘතියෙන් රටේ සමස්ථ ආර්ථිකයේ සිදුවන පිබිදීම, ආර්ථිකයේ ඇතිවන වර්ධනය හා ප්‍රසාරණය මෙම ණය ලබා ගැනීමේදී රජයේ විශේෂ සැලකිල්ලට යොමුවිය. මුදල් අමාත්‍යංශය මේ ගැන කරනු ලැබූ පිරිවැය වාසි විග්‍රහයෙන්ද ණය මුදල ලබාගැනීමේ යෝග්‍යතාව තහවුරුවූ බව සඳහන් වෙයි.

නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයට ණය ලබාගත් ක්‍රමවේදයට වඩා මදක් වෙනස් ක්‍රමවේදයක් හම්බන්තොට වරාය ව්‍යාපෘතියට ණය ලබාගැනීමේදී අනුගමනය කරන්නට රජයට සිදුවිය. විදුලිය උත්පාදන ව්‍යාපෘතියක් මෙන් නොව සෘජුවම අපනයන සංවර්ධනයට බලපාන වරාය ඉදිකිරීමේ ව්‍යාපෘතිය වැන්නක් සඳහා ජාත්‍යන්තරයෙන් නියමවන පොලිය තරමක් ඉහළය. ඒ අනුව හම්බන්තොට වරාය ව්‍යාපෘතියේ මුල් අදියර සඳහා රජයට ලැබුණ ණය මුදල් වෙනුවෙන් 6%ක ස්ථාවර පොලී අනුපාතයක් නියම කෙරිණි. මේ ණය ගෙවීම සඳහා වසර 15ක කාලයක් ලැබේ. ඉන් වසර තුනක් සහන කාලයකි. වසර තුනක සහන කාලය හමාරවීමෙන් පසු ණය ගෙවීම ආරම්භ වෙයි.

හම්බන්තොට වරායේ දෙවැනි අදියර සඳහාද විදේශ ණය ලබා ගැනෙයි. මෙම ණය මුදල සඳහා පැනවෙන කොන්දේසි පළමු අදියරේ කොන්දේසි වලට වඩා ලිහිල්ය. දෙවැනි අදියර වෙනුවෙන් ලැබෙන ණය ගෙවීම පිණිස වසර 20ක කාලයක් නියමකර ඇත. එසේම ණය පොලී අනුපාතය 2%ක් තරම් අඩු ප්‍රතිශතයකි. හම්බන්තොට වරායේ දෙවැනි අදියර සඳහා වඩා පහසු කොන්දේසි මත ණය ලබා ගැනීම නිසා සමස්ථ ව්‍යාපෘතියේ සාමාන්‍ය පොලී අනුපාතය අඩුවෙයි. එසේම ණය ආපසු ගෙවීමද සහනදායී ක්‍රමවේදයකට යටත්වෙයි. දැවැන්ත ව්‍යාපෘති සඳහා ණය ලබාගැනීමේදී අපට ගැලපෙන ප්‍රායෝගික ක්‍රමවේද අනුගමනය කිරීමෙන් රටට හිතකර ලෙස ණය පාලනය කරගන්නට පිළිවන්ය.

වරායක් තැනීමට වඩා වෙනස් මහා මාර්ග - වාරිමාර්ග හා ජලසම්පාදනය වැනි කටයුතු සඳහා ණය ලබා ගැනීමේදී අපි වඩාත් සහනදායී පිළිවෙතකට යටත්ව ණය ලබාගැනීමට සමත් වීමු. මෙබඳු සමාජ යටිතල පහසුකම් සම්පාදනයට හිමිවන ණය ගෙවීමට ලැබෙන කාලය වසර 20 සිට වසර 40 දක්වා වන දීර්ඝ කාලයකි. එසේම  ඇතැම් අවස්ථාවල වසර 15ක් තරම් කෙටිකලකින් ගෙවිය හැකි ණය පහසුකම්ද මෙබඳු ව්‍යාපෘති වෙනුවෙන් ලබාගැනෙයි. මේ ආකාරයට ණය මුදල් වල මිශ්‍රණයක් ඇති කිරීමෙන්ද රටට ප්‍රයෝජනයක් ලැබෙයි.

වාරිමාර්ග ජලසම්පාදන හා මහා මාර්ග සංවර්ධනය වැනි කටයුතු සඳහා ශ්‍රී ලංකාව ණය මුදල් ලබාගන්නේ අපට හිතවත් මිත්‍ර රටවලිනි. ඒ අනුව ඉතාමත් සීමිත ලෙස රාජ්‍ය ආයෝජන සඳහා දායක වෙමින් සිටි ඉන්දියාව, චීනය, කොරියාව හා නැගෙනහිර යුරෝපීය රටවල් මෙන්ම මැදපෙරදිග සංවර්ධන ආයතන රාශියක් ගතවූ වසර 6 තුල (2005 - 2011 කාලයේ) අපේ සංවර්ධන යෝජනා ක්‍රමවලට මූල්‍ය දායකත්වය සැපයීය. මෙයට අතිරේකව ලෝක බැංකුව හා ආසියානු සංවර්ධන බැංකුවද සෑම වසරකම අප රටට අවශ්‍ය ණය සම්පාදනය සඳහා උදව් පදව් වෙමින් ලබාදුන් අනුග්‍රහය අගය කළ යුතුය.

ඇමෙරිකා එක්සත් ජනපදය හා යුරෝපා සංගමයේ රටවල් සහ ශ්‍රී ලංකාව අතර තිබෙන ආර්ථික සහයෝගීතාව කිසිසේත්ම දුර්වල වී නැත. විශාල අරමුදල් සැපයුමක් නැතත් මෙම පාර්ශව දෙකද විවිධ මට්ටම් වලින් ශ්‍රී ලංකාවේ සංවර්ධන කටයුතු සඳහා අතහිත දෙයි. එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් ලෝක ආහාර සංවිධානය, ලෝක සෞඛ්‍ය සංවිධානය, ලෝක ළමා සංවර්ධන සංවිධානය - ලෝක කම්කරු සංවිධානයද විවිධ යෝජනා ක්‍රම ඔස්සේ මේ රටට ආර්ථික සහන පිරිනමයි. ඒ අනුව රටේ ආර්ථික සංවර්ධනය සඳහා ඉහළ මට්ටමේ විදේශ ආධාර උපයෝජනයක් සිදු වෙයි. ශ්‍රී ලංකාව කෙරේ ජාත්‍යන්තරය තබා ඇති විශ්වාසය මෙන්ම ලෝකය සමග හොඳහිත වර්ධනය වීම නිසා මේ උපකාර හිමිවන බව අමුතුවෙන් කිවයුතු නැත.

# ආයෝජන නිවැරදි මාවතට යොමු කිරීම

දියුණුවන රටක ආර්ථික වර්ධනය උදෙසා විදේශ ආයෝජන අත්‍යාවශ්‍යය. අතීතයේ විදේශ ආධාර ගැන උනන්දු වූ රටවල් දැන් විදේශ ආයෝජන ගැන උනන්දුවෙයි. අපේ රටට වැඩිපුර විදේශ ආයෝජන එන්නට පටන් ගත්තේ 70 දශකය අගභාගයේ සිටය. 1977-2005 අතර කාලයේ පැවති විවිධ ආණ්ඩු විදේශ ආයෝජන දිරිගැන්වීමේ උපක්‍රමය ලෙස භාවිතා කළේ පෞද්ගලිකකරණයයි. ආණ්ඩුවේ දේපොල පෞද්ගලික අංශයට පවරාදීම පෞද්ගලිකකරණයයි. ඒ අනුව රජයේ වැවිලි සමාගම් (වතු) දුරකතන සේවා, ලිහිසි තෙල්, රජය ඉදිකළ හෝටල්, සිමෙන්ති කර්මාන්තශාලා, වානේ, ටයර්, රෙදිපිළි වැනි රාජ්‍ය අංශය සතුව තිබූ ප්‍රධාන කර්මාන්ත හා ව්‍යාපාර පෞද්ගලිකකරණය කරනු ලැබීය.

1977-2005 කාලයේ ආයෝජන ඇදගන්නට භාවිතකළ මෙම උපක්‍රමය අර්බුද රැසකට හේතුවූවකි. විනිවිදභාවයෙන් තොරව  ක්‍රියාත්මක වූ මේ ක්‍රමය ඔස්සේ දිගුකාලීන බදු සහන විවිධ ආයතන හරහා පිරිනමමින් ආයෝජන දිරිගන්වනු ලැබීය. මේ නිසා රටේ ආයෝජන පරිසරය ව්‍යාකූල විය. එක් ආයෝජනයක් සඳහා දෙනු ලබන වරප්‍රසාද හෝ සහන තවත් ආයෝජනයට දෙන සහන හා වරප්‍රසාදවලට වෙනස්විය. එකම වර්ගයේ ආයෝජන සඳහා ආයෝජකයන් දෙදෙනෙකුට ලැබුන වරප්‍රසාද ද නොගැලපුනි. මේ ව්‍යාකූල බව නිසා අක්‍රමවත් ලෙස රජයේ ඉඩම් හා දේපල පෞද්ගලික අංශයට පැවරිනි. ඇතැම් ඉඩම් දිගුකාලීනව බද්දට දෙනු ලැබීය. තවත් ඉඩම් ප්‍රථමයෙන්  දිගුකාලීන බදු පදනම මත ලබා දී  සින්නක්කර අයිතිය ලැබෙන ආකාරයටත් පවරාදුනි. මෙසේ පවරාදුන් සමහර ඉඩම්වල තක්සේරු වටිනාකමවත් රජයට හිමිවූයේ නැත. අද කොළඹ පිහිටි ඇතැම් ප්‍රධාන හෝටල් සහ දැවැන්ත ගොඩනැගිලි සඳහා පවරාදුන් ඉඩකඩම්වලට පවා මුදල් ලැබී නැත. එපමණක් නොව මේ ආයතන විසින් පසු කාලයේ රජයට ගෙවිය යුතු දිගුකාලීන බදු මුදල් ගෙවීමද පැහැරහැරිනි. මෙහි හාස්‍යජනකම කරුණ වූයේ විදේශ ආයෝජන ගෙනෙන මුවාවෙන් රටට පැමිණි ඇතැම් සමාගම් මේ රටේ රාජ්‍ය බැංකුවලින් ණය ලබාගෙන ව්‍යාපාර ආරම්භ කිරීමයි. එවිට

ආයෝජන මණ්ඩල වරප්‍රසාද යටතේ රටට පැමිණ බදු සහන සියල්ල ලබාගෙන විදේශ මුදල් වැය නොකොට මේ රටේ අරමුදල් වලින් ව්‍යාපාර පවත්වාගෙන යාමට හැකිවිය. මෙය සැබැවින්ම "විදේශ ආයෝජන" යන අරුත උඩු යටිකුරු කිරීමකි. මේ විකෘති ආයෝජන පරිසරය 1977 සිට 2005 දක්වාම රටේ පැවතුනි.

වත්මන් රජය 2005 බලයට පත්වීමත් සමග රාජ්‍ය ව්‍යාපාර පෞද්ගලිකකරණය කිරීම සහමුලින්ම නතර කරනු ලැබීය. 2005-2011 කාලය තුළ එකදු රාජ්‍ය ආයතනයක් හෝ පෞද්ගලික අංශයට පවරා දී නැත. 2005 වර්ෂයට පෙර පෞද්ගලිකකරණය කර තිබූ ශ්‍රී ලන්කන් ගුවන් සේවය, ශ්‍රී ලංකා රක්‍ෂණ සංස්ථාව, ෂෙල් ගෑස් සමාගම වැනි ආයතන නැවත රජයේ අයිතිය යටතට ගැනීමට ද වත්මන් රජය ක්‍රියා කළේය. වඩාත් ජනතාවාදී සේවාවක් උදෙසා රාජ්‍ය අංශය ශක්තිමත් කෙරිණි. පසුගිය ආණ්ඩුවක් විසින් පෞද්ගලික අංශයට පවරාදීමට හඳුනාගෙන තිබූ ඉන්ධන පිරවුම්හල් 100ක් පෞද්ගලිකකරණය කිරීම අත්හිටුවිය. ඊට සමගාමීව සතොස, වී අලෙවි මණ්ඩලය, මහජන බැංකුව, ලංගමය, දුම්රිය සේවය ආදී රාජ්‍ය ව්‍යාපාර ශක්තිමත් කිරීමට විශාල ප්‍රාග්ධන මුදලක් රජය විසින් වෙන් කරන ලදී. රජයේ අධීක්‍ෂණය හා සුපරීක්‍ෂණය නිසා කලකට පෙර විනාශයට යමින් තිබූ රාජ්‍ය ව්‍යාපාර ගණනාවක් ශක්තිමත්ව ලාභ ලබන තත්ත්වයට පත්ව තිබේ.

රටේ සංවර්ධනය සඳහා රාජ්‍ය අංශයත් පෞද්ගලික අංශයත් එකසේ දායකවිය යුතුබව රජයේ ප්‍රතිපත්තියයි. සමහර රටවල් වැඩිපුර දිරිගන්වන්නේ මේ ක්‍රමවේදයයි. 30 අවුරුදු යුද්ධය හමාරවීමෙන් පසු රටේ ආයෝජන හා ව්‍යාපාර පරිසරය වඩාත් ශක්තිමත් අඩියකට පත්ව තිබේ. මේ නිසා රජය රටේ භෞතික යටිතල පහසුකම් විධිමත් හා ස්ථාවර ලෙස ගොඩනැගීමට දැඩි කැපවීමෙන් ක්‍රියා කරයි. විදුලිය, මහාමාර්ග, වරාය, වාරිමාර්ග, ජලසම්පාදන වැනි යටිතල පහසුකම් විධිමත් ලෙස ජනතාවට සැපයීම රජයේ ප්‍රධාන අරමුණයි. වර්ෂ 30ක් තුළ නොසලකාහැර තිබූ ගම්දනව්වලට පවා අද සංවර්ධනයේ හිරු රැස් වැටෙන්නට පටන්ගෙන තිබේ. උතුරට මෙන්ම දකුණටත් බස්නාහිරට මෙන්ම නැගෙනහිරටත් සමාන්තර සංවර්ධනයක් ලබාදීම රජයේ පිළිවෙතයි.

පසුගිය වසර 6 තුළ මාර්ග සංවර්ධනය අතින් මෙරට ලැබූ දියුණුව විශිෂ්ට නොව අතිවිශිෂ්ට යයි කිවහැක. කාපට් මාර්ග හා කොන්ක්‍රීට් මාර්ග සංස්කෘතියක් බිහිවිය. ඇතැම් දිස්ත්‍රික්කවල

ජනතාවගෙන් සියයට සියයක්ම විදුලිබල පහසුකම ලබාතිබේ. 2015 වනවිට රටේ සෑම පුරවැසියකුටම විදුලිබල පහසුකම ලබාදීම රජයේ අරමුණයි, සැලසුමයි. මේ කටයුතු සඳහා රජයේ ආයෝජන ජාතික ආදායමෙන් 6% ක මට්ටමේවත් තබාගන්නට සිදුවෙයි. 2005 ට පෙර එවැනි ආයෝජනයක් කිරීමට අයවැයෙන් ප්‍රමාණවත් ඉඩක් ලැබුනේ නැත. එකළ අයවැය කළමනාකරණය කළ ආකාරය අනුව රාජ්‍ය අයවැයෙහි අතිරික්තයක් නොවීය. රජයේ ආදායම සෑහුනේ එදිනෙදා වියදමට පමණි. එවිට ආයොජන සඳහා වැය කරන්නට මුදල් ඉතිරි නොවීය. මේ තත්ත්වයෙන් රාජ්‍ය මූල්‍ය අංශය මුදවාගෙන අයවැය නිසිලෙස කළමනාකරණය කරන්නට වත්මන් රජයට විශාල පරිශ්‍රමයක් දරන්නට සිදුවිය.

ආයෝජන කටයුතු සඳහා පෞද්ගලික අංශයට ද ඇරැයුම් කෙරිණි. විදේශීය මූල්‍ය ආයෝජන ද දිරිමත් විය. විශාල පරිමාණයේ යටිතල පහසුකම් සම්පාදන ව්‍යාපෘති සඳහා යන්ත්‍රසූත්‍ර පිටරටවලින් මිලදී ගැනීමට දේශීය මුදල් පමණක් යොදාගැනීම හෙළ ක්‍රමවේදයන් නොවන නිසා විදේශ අරමුදල් සපයා ගැනීමට සිදුවෙයි. ඒවා හිතවත් විදේශ රටවලින් මෙන්ම විදේශීය ආයතන වලින් ලබාගැනිණ. මේවායින් ඇතැම් අරමුදල් දිගුකාලීන ණය මුදල්ය. තවත් ආධාර හා පරිත්‍යාග ද ලැබිණි. වාණිජමය, සංවර්ධනය සඳහා අනුග්‍රහය හිමිවන ණය ක්‍රම අපට උපයෝගී කරගන්නට සිදුවූ බව ප්‍රකට කරුණකි.

ණය මුදල් ලබාගැනීමේදී රජය සලකා බලන්නේ ඒවා සපයන රටවල් හා ආයතන වලින් රටට හිතකර කොන්දේසි යටතේ ණය ලබාගැනීමටයි. මුදල් ලබාගැනීමේ වුවමනාව මත රටට අහිතකර කොන්දේසිවලට යටත්ව ණය ලබාගන්නට වත්මන් රජය ක්‍රියාකර නැත. මෙම ක්‍රමවේදය අනුව ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, චීනය, ජපානය, ඉන්දියාව ආදී විවිධ රටවල් ණය හා ආධාර සපයමින් ශ්‍රී ලංකාවේ ඉදිරි ගමනට බෙහෙවින් උදව් උපකාර කළේය. ලෝක බැංකුව හෝ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ආයතන ණය සපයන්නේ රටට අහිතකර කොන්දේසිවලට යටත්ව යැයි කලක් පැවති මතවාද නිෂ්ප්‍රභාකර එම ආයතන වලින්ද රටට හිතකර ණය මුදල් ලබාගන්නට මේ රජය සමත්විය. මෙය විදේශ ණය අංශයෙන් රජය ලැබූ පෙරළිකාර ජයග්‍රහණයකි. ඒ අනුව රටට ගැලපෙන කොන්දේසි අනුව විදේශ ණය ලබාගැන්ම දුෂ්කර බවට සමහරුන් විසින් පතුරුවා තිබූ මතවාද ප්‍රතික්ෂේපවී තිබේ.